## පේරාදෙනියෙ එකහිත ඇති මහත්තුරූ

දස දෙස නිවැසි හිත මිතුරන් සපිරි වැරූ
සරසවි බිමේ සුන්දර පරිසරය තුරූ
පේරාදෙනියෙ එකහිත ඇති මහත්තුරූ
වෙන්වී නොයනු ඇත මේ කප තියෙනතුරූ

මහවැලි දෑලවර සරසවි උයන් තෙර
ගිරිහෙල් මැදින් හන්තානට ගමන් කර
ගත කළ අතීතය හමුවේ හැඟුම් බර
මතකයි ගෙතූ සුන්දර කවි කතන්දර

කලා කෙත නිබඳ අස්වද්දනු කැමති
විසේ ඇති එවුන් කිසිදා හැර නොයති
සදා ළබැඳි හිත මිතුරනි යහ ගුණැති
ඔබේ ඇසුර අප පින්කළ පෙර නිමිති

කොතරම් කාලයක් ගෙවුනත් එක දිගට
පදනම් පවුරු නොබැඳුනි ලෙන්ගතු කමට
කඳුහෙල් ගිරි ශිඛර බෑවුම් නැත අවට
**තනියායක්ය ලෝකය කවදත්** අපට